සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය I
கிறிஸ்தவ நாகரிகம் I
Christian Civilization I

49 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **පිළිතුරු පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** මෙසපොතේමියාව පිහිටා ඇත්තේ කුමන ගංගාව ආසන්නයේ ද?
(1) නයිල් (2) යාර්මුක්
(3) ජෝර්දාන් (4) යුප්‍රටීස්-ටයිග්‍රීස්
(5) සෙරෙද්

**2.** පැරණි ගිවිසුමේ ග්‍රීක් භාෂාවෙන් සම්පාදනය වූ ග්‍රන්ථ තුනක් වන්නේ,
(1) සලමොන්ගේ ප්‍රඥාව, I මකබි සහ II මකබි ය.
(2) රූත්, ජෝබ් සහ ප්‍රේම ගී ය.
(3) I වංශාවලිය, II වංශාවලිය සහ ජෝබ් ය.
(4) ප්‍රේම ගී, I මකබි සහ II මකබි ය.
(5) මීකා, I වංශාවලිය සහ II වංශාවලිය ය.

**3.** 'වල්ගේට්' ලෙස හඳුන්වන බයිබලයේ ලතින පරිවර්තනය කාගේද?
(1) ටර්ටූලියන්තුමාගේ ය. (2) ජෙරොම්තුමාගේ ය.
(3) ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල්තුමාගේ ය. (4) අගුස්තීනුතුමාගේ ය.
(5) තෝමස් අක්වයිනස්තුමාගේ ය.

**4.** බැබිලෝනියානු පාලනයට පසු හා ග්‍රීක පාලනයට පෙර ජුදාවරු යටත් වූයේ කුමන රාජ්‍යයට ද?
(1) පිලිස්තිය (2) ෆිනීෂිය (3) රෝමය
(4) ඊජිප්තුව (5) පර්සියාව

**5.** ජෝර්දාන් නදියට නැගෙනහිරින් පිහිටි කඳුවල භූගෝලීය ඒකක වන්නේ,
(1) බාෂාන්, ගිලියද් සහ නෙගෙබ් ය. (2) බාෂාන්, ගිලියද් සහ සමරියාව ය.
(3) ඒදොම්, නෙගෙබ් සහ එස්ද්‍රඑලොන් ය. (4) ආමොන්, මොවාබ් සහ ඒදොම් ය.
(5) ෂාරොන්, මොවාබ් සහ අමොන් ය.

**6.** කපර්නාවුමට ආසන්නම නගරය වන්නේ,
(1) තිබේරියස් ය. (2) බෙත්සයිදා ය.
(3) සෙසරියා ය. (4) ජෙරිකෝ ය.
(5) බෙයර්ෂෙබා ය.

**7.** දාවිත් රජ සමයේ ඊශ්‍රායලය එක්සේසත්ව තිබිණි. එය දෙකඩ වූයේ කුමන දාවිත් වාංශික රජුගේ පාලන සමයේ දී ද?
(1) සලමොන් (2) ජොෂියා
(3) රෙහොබොවාම් (4) ජෙරොබොවාම්
(5) සෙදකියා



Department of Examinations - Sri Lanka

**8.** මහා ඇලෙක්සැන්ඩර්ගේ මරණයෙන් පසු පලස්තීනය අත්පත් කර ගන්නා ලද්දේ,
(1) සෙලූසිද්වරු ය. (2) ටොලමිවරුන් ය. (3) හෙරෝදියානුවන් ය.
(4) පිනීෂියානුවන් ය. (5) අන්තියෝකියානුවන් ය.

**9.** රෝම පාලකයන් සමග මිතුදමින් කටයුතු කළ යුදා කණ්ඩායම වූයේ,
(1) සදුසිවරු ය. (2) පරිසිවරු ය.
(3) එසේනිවරු ය. (4) සෙලොට්වරු ය.
(5) ලේකම්වරු ය.

**10.** පහත ප්‍රකාශ සලකා බලන්න.
A - පාස්කු මංගල්‍යය, ඊශ්‍රායෙල්වරුන් ඊජිප්තුවෙන් විමුක්තිය ලැබීම ස්මරණය සඳහා සිදුකරන ලද්දකි.
B - දේව මාලිගය කැප කිරීමේ මංගල්‍යය විප්‍රවාසයට පෙර සිදුකරන ලදී.
C - කූඩාරම් මංගල්‍යය හඳුන්වන ලද්දේ 'යෝම් කිප්පූර්' යනුවෙනි.
D - කූඩාරම් මංගල්‍යය සමරණ ලද්දේ සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවල ය.
E - පෙන්තකොස්ත මංගල්‍යය සති මංගල්‍යය ලෙස ද හඳුන්වන ලදි.
මේවායින් පුරාණ ඊශ්‍රායල්වරුන්ගේ මංගල්‍යයන් පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A, B සහ C ය. (2) A, D සහ E ය. (3) B, C සහ D ය. (4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**11.** පහත ප්‍රකාශ සලකා බලන්න.
A - සාවුල් රජු ජුදා ගෝත්‍රයට අයත් විය.
B - දාවිත් රජු ජෙස්සේගේ වැඩිමහල් පුත්‍රයා ය.
C - දාවිත් රජු විසින් ජෙරුසලම සිය අගනගරය කර ගන්නා ලදි.
D - ආහාස් රජු විසින් දකුණු රාජ්‍යය පාලනය කරන ලදි.
E - යෙසායා දිවැසිවරයා ජීවත්වූයේ ආහාස් රජු සමයේ ය.
මේවායින් පුරාණ ඊශ්‍රායලයේ රජවරුන් පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) B, C සහ D ය. (4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**12.** ක්‍රි.පූ. 722 දී උතුරු රාජ්‍යය යටත් කර ගන්නා ලද්දේ,
(1) අසිරියානුවන් ය. (2) බැබිලෝනියානුවන් ය.
(3) පර්සියානුවන් ය. (4) ග්‍රීකයන් ය.
(5) රෝමවරුන් ය.

**13.** මහා හෙරෝද් රජුගේ මරණයෙන් පසුව ගලීලය පාලනය කරන ලද්දේ,
(1) පිලිප් ය. (2) පිලාත් ය.
(3) අර්කෙලාවුස් ය. (4) හෙරෝද් ඇන්ටිපස් ය.
(5) I වන හෙරෝද් අග්‍රිප්පා ය.

**14.** "දෙවියන්වහන්සේගේ රාජ්‍යය ළඟාවී තිබේ. මන්ස්ථාපනය වන්න. සුබ අස්න අදහා ගන්න." (මාක් 1:15) ක්‍රිස්තුන්වහන්සේ මෙම වදන් ප්‍රකාශ කරන ලද්දේ,
(1) අයබදු අය කරන්නා හමු වූ විට ය.
(2) නාසරතයේ සිනගෝගයෙහි දේශනා කළ විට ය.
(3) කන්ද උඩ දේශනාව අවස්ථාවේ දී ය.
(4) පේදුරුතුමන් ශ්‍රාවකයෙකු වීමට කැඳවූ මොහොතේ ය.
(5) බෞතීස්මය ලබා ජොර්දාන් නදියෙන් ගොඩට පැමිණි විටය.

**15.** පහත ප්‍රකාශ සලකා බලන්න.
A - උපතේ සිට ජේසුන්වහන්සේව දැන සිටීම
B - ජේසුන්වහන්සේ විසින් ම කැඳවනු ලැබීම
C - යුදා නීතිය මැනවින් දැන සිටීම
D - කුරුසිය දරාගෙන ජේසුන්වහන්සේව අනුගමනය කිරීමට සූදානම්ව සිටීම
E - සුබ අස්න දේශනා කිරීමට ඇති මහගු හැකියාව
මේවායින් ජේසුන්වහන්සේගේ ජීවිත කාලයේ දී උන්වහන්සේගේ ශ්‍රාවකයෙකු වීම සඳහා පිළිපැදිය යුතු වැදගත් කොන්දේසි වූයේ,
(1) A සහ B ය. (2) A සහ D ය. (3) B සහ D ය. (4) C සහ D ය. (5) C සහ E ය.

Department of Examinations - Sri Lanka

[තුන්වැනි පිටුව බලන්න.

**16.** ජේසුන්වහන්සේ විසින් කන්ද උඩ දේශනාවේ දී විස්තර කරන ලද ජුදා භක්ති අභ්‍යාස තුන වන්නේ,
(1) දන්දීම, යාච්ඤාව සහ උපවාසය ය. (2) යාච්ඤාව, උපවාසය සහ මර්දන ක්‍රියා ය.
(3) යාච්ඤාව, මර්දන ක්‍රියා සහ දන්දීම ය. (4) උපවාසය, මනස්ථාපනය සහ දන්දීම ය.
(5) දන්දීම, උපවාසය සහ මර්දන ක්‍රියා ය.

**17.** දේව රාජ්‍යය පිළිබඳ උපමාවන් මොනවාද?
(1) අබ ඇටය, යහපත් සමරිතානුවරයා, නිධානය සහ මුතු ඇටය
(2) නිධානය, මුතු ඇටය, නැති වූ බැටළුවා සහ අබ ඇටය
(3) මාළු දැළ, නිධානය, නැති වූ කාසිය සහ මුතු ඇටය
(4) අබ ඇටය, නිධානය, මුතු ඇටය සහ මාළු දැළ
(5) මුතු ඇටය, අබ ඇටය, නාස්තිකාර පුත්‍රයා සහ මාළු දැළ

**18.** දේව රාජ්‍යය උදෙසා වැය වූ ජේසුන්වහන්සේගේ ජීවිතයේ, උච්චතම අවස්ථා නිරූපණය කරන ජීවිත සිද්ධීන් වන්නේ, උන්වහන්සේගේ
(1) උපත, මරණය, සහ උත්ථානයයි. (2) දුක්විඳීම, මරණය සහ උත්ථානයයි.
(3) උපත, බෞතීස්මය සහ මරණයයි. (4) දුක්විඳීම, දූත කාර්යය සහ උත්ථානයයි.
(5) දුක්විඳීම, මරණය සහ ස්වර්ගාරෝහණයයි.

**19.** මුල් කිතුනුවන්ට පැවරුණු සතර වැදගත් කාර්ය වන්නේ,
(1) ඉගැන්වීම, සාංඝික ජීවිතය, ප්‍රාතිහාර්ය පෑම සහ පූප කැඩීමයි.
(2) අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීමට සවන් දීම, සාංඝික ජීවිතය, පූප කැඩීම සහ යාච්ඤාවයි.
(3) ඉගැන්වීම, ප්‍රාතිහාර්ය පෑම, පූප කැඩීම සහ යාච්ඤාවයි.
(4) දේශනා කිරීම, ඉගැන්වීම, යාච්ඤාව සහ පූප කැඩීමයි.
(5) යාච්ඤාව, දේශනා කිරීම, සාංඝික ජීවිතය සහ පූප කැඩීමයි.

**20.** පහත ප්‍රකාශ සලකා බලන්න.
A - ග්‍රීක බස කතාකරන ජුදා ක්‍රිස්තියානි වැන්දඹුවන්ට සේවය කිරීමට තෝරාගනු ලැබූවන්
B - ශුද්ධාත්මයන්වහන්සේගෙන් සහ ප්‍රඥාවෙන් පූර්ණ වූවන්
C - හෙබ්‍රෙව් බස කතාකරන කිතුනුවන්ට සේවය කිරීමට පත්කරනු ලැබූවන්
D - සුබ අස්න දේශනා කිරීමට අපෝස්තුළුවරුන් විසින් තෝරාගනු ලැබූවන්
E - මුල් කිතුනු සභාවේ සාමාජිකයින් අතුරෙන් තෝරාගනු ලැබූ සුදුසු පුරුෂයන් සත්දෙනා
මේවායින් අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතට අනුව උපස්ථායක පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ E ය. (3) A, C සහ E ය. (4) B, C සහ E ය. (5) B, D සහ E ය.

**21.** පහත ප්‍රකාශ සළකා බලන්න.
A - ඔහු සයිප්‍රස්හි වැසියෙකි.
B - ඔහු දේව භය ඇති ජුදා ජාතිකයෙකි.
C - ඔහු දමස්කය කරා යන අතරතුර ඔහුගේ සිත්හැරීම සිදුවිය.
D - ශුද්ධ වූ මාක්තුමා ඔහුගේ ශ්‍රාවකයෙකි.
E - ඔහුගේ ධර්මදූතික ගමන් අන්තියෝකයෙන් ආරම්භ විය.
මේවායින් ශුද්ධ වූ පාවුලුතුමා පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A, B සහ C ය. (2) A, C සහ D ය. (3) B, C සහ D ය. (4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**22.** ශුද්ධ වූ පාවුළුතුමාගේ මූලික ධර්මදූතික ක්‍රමවේද වූයේ,
(1) ධර්මදූතික ගමන් සහ සුවිශේෂ ලිවීම ය.
(2) ලිපි ලිවීම සහ ජුදාවරුන්ට දේශනා කිරීම ය.
(3) ධර්මදූතික ගමන් සහ ලිපි ලිවීම ය.
(4) සංඝ ගොඩනැගීම සහ ප්‍රාතිහාර්ය පෑම ය.
(5) ධර්මදූතික ගමන් සහ ජුදාවරුන්ට දේශනා කිරීම ය.

**23.** ශුද්ධ වූ පාවුළුතුමාගේ දෙවන ධර්මදූතික ගමනට සම්බන්ධ වූ වැදගත් පුද්ගලයන් තිදෙනා වූයේ,
(1) සීලස්, තිමති සහ ලූක් ය. (2) බර්නබස්, ලූක් සහ ජාකොබ් ය.
(3) පේදුරු, බර්නබස් සහ මාර්ක් ය. (4) බර්නබස්, සීලස් සහ ලූක් ය.
(5) ජාකොබ්, ජුවාම් සහ බර්නබස් ය.

Department of Examinations - Sri Lanka

**24.** සභාවේ මුල් සියවස් තුන, වීර සමයක් නැතහොත් ප්‍රාණපරිත්‍යාගීවරුන්ගේ යුගයක් ලෙස සලකනු ලැබීමට ප්‍රධාන හේතුව කුමක් ද?
(1) රෝමානු අධිරාජ්‍යවරුන් දස දෙනෙකුට වඩා සභාව පීඩනයට පත් කරනු ලැබූ නිසා ය.
(2) ජුදා පීඩනයෙන් පසුව රෝම පීඩනයට හසු වූ නිසා ය.
(3) වන්දනාව තහනම් කිරීමත් ක්‍රිස්තියානුවරුන්ගේ ඉඩකඩම් රජයට පවරාගනු ලැබීමත් සිදුවුවද ඔවුන් බියට පත් නොවූ නිසාවෙනි.
(4) බොහෝ පීඩනවලට මුහුණ දුන් නමුත් පීඩාවන් පිළිබඳ නියම අරුත් ඔවුනට පහදා දුන් නිසා ය.
(5) බොහෝ පීඩනවලට මුහුණ දුන් නමුත් සභාව සීඝ්‍රයෙන් වර්ධනය වූ නිසා ය.

- පහත සඳහන් වගුවේ A සිට H දක්වා ඇති ජුදා හා රෝම පීඩනය පිළිබඳ කරුණු ඇසුරෙන් ප්‍රශ්න අංක **25** සිට **26** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| A - පේදුරුතුමා කුරුසපත් කරනු ලැබීම සහ මරණයට පත් කරනු ලැබීම | B - ශුද්ධ වූ සෙබස්තියන් මුනිඳුන්ගේ ප්‍රාණපරිත්‍යාගිවරය |
| C - ක්‍රිස්තියානිවරුන් පිටුවහල් කරනු ලැබීම | D - කාන්තාවන් සිරගත කරනු ලැබීම |
| E - ශුද්ධ ෆිලික්ස් (පේලියස්) තුමන්ගේ ප්‍රාණපරිත්‍යාගිවරය | F - ක්‍රිස්තියානිවරුන් ගෙන්දගම් ආලේප කර ගිනිබත් කරනු ලැබීම |
| G - පාවුලුතුමාගේ ගෙල සිඳිනු ලැබීම | H - ශුද්ධ වූ දමියානුතුමාගේ (Damian) ප්‍රාණපරිත්‍යාගිවරය |

**25.** නීරෝ අධිරාජ්‍යයාට සම්බන්ධ යුගලය වන්නේ,
(1) A හා B ය. (2) A හා G ය. (3) C හා H ය.
(4) D හා E ය. (5) G හා H ය.

**26.** දියෝක්ලේසියානු අධිරාජ්‍යයාට සම්බන්ධ යුගලය වන්නේ,
(1) B හා D ය. (2) C හා E ය. (3) D හා F ය.
(4) E හා G ය. (5) E හා H ය.

**27.** පහත ප්‍රකාශ සලකා බලන්න.
A - සිය සේවාව තුර්කියේ දී සිදුකරන ලදි.
B - පොලිකාප්තුමාගේ ශ්‍රාවකයෙකි.
C - 'මිත්‍යාමත බිඳීම හෝ වෙදහෙද ප්‍රතික්ෂේප කිරීම' යන ග්‍රන්ථය සම්පාදනය කළේය.
D - දියෝක්ලේසියානු අධිරාජ්‍යයාගේ සමයේ ප්‍රාණපරිත්‍යාගි විය.
E - වසර 25ක් රදගුරුවරයෙකු ලෙස කටයුතු කරන ලදි.
මෙවායින් ශුද්ධ වූ ඉරේනියස්තුමා පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A, B සහ C ය. (2) A, D සහ E ය. (3) B, C සහ D ය. (4) B, C සහ E ය. (5) B, D සහ E ය.

**28.** ජගත් මන්ත්‍රණ සභා සහ ඒවායේ සාකච්ඡා කරන ලද වෙදහෙද පහත සඳහන් කර ඇත. ඒවා අතුරෙන් නිවැරදි යුගලය වන්නේ,
(1) එපිස මන්ත්‍රණ සභාව - නෙස්ටෝරියානු වාදය
(2) නිසියානු මන්ත්‍රණ සභාව - යුතිකියානු වාදය
(3) ජෙරුසලම් මන්ත්‍රණ සභාව - පෙලාජියානුවාදය
(4) කොන්ස්තන්තිනෝපල් මන්ත්‍රණ සභාව - ඒරියන්වාදය
(5) කැල්සිඩොන් මන්ත්‍රණ සභාව - මසදෝනියානුවාදය

**29.** පහත දී ඇති ග්‍රන්ථ අතුරෙන් ඇතනේසියස්තුමන් විසින් රචිත ග්‍රන්ථ කාණ්ඩ වන්නේ,
(1) දින හයේ මැවිල්ල සහ ඒරියන්වරුන්ගේ ඉතිහාසයයි.
(2) මාංශගත වීම සහ ඒරියන්වරුන්ගේ ඉතිහාසයයි.
(3) ශුද්ධ අන්තෝනි තාපසතුමාගේ ජීවිත කථාව සහ ශුද්ධාත්මයාණෝයි.
(4) දින හයේ මැවිල්ල සහ ශුද්ධාත්මයාණෝයි.
(5) දින හයේ මැවිල්ල සහ මාංශගත වීමයි.

department of Examinations - Sri Lanka

Past Papers Wiki



**30.** යුරෝපයේ සේවය කරන ලද ධර්මදූතවරුන් වූයේ,
(1) මහා ග්‍රෙගරිතුමා, පැට්රික්තුමා සහ පැකෝමියස්තුමා ය.
(2) බොනිෆස්තුමා, කොලුම්බාතුමා සහ ඇතනේසියස්තුමා ය.
(3) මහා ග්‍රෙගරිතුමා, බොනිෆස්තුමා සහ ෆ්‍රැන්සිස් සේවියර්තුමා ය.
(4) කොලුම්බාතුමා, බොනිෆස්තුමා සහ මහා ග්‍රෙගරිතුමා ය.
(5) ෆ්‍රැන්සිස් සේවියර්තුමා, පැට්රික්තුමා සහ බොනිෆස්තුමා ය.

**31.** සභාවේ මධ්‍යතන යුගයට අයත් ආසන්න ම කාල පරිච්ඡේදය කුමක්ද?
(1) ක්‍රි.ව. 700 - 1200
(2) ක්‍රි.ව. 800 - 1500
(3) ක්‍රි.ව. 800 - 1700
(4) ක්‍රි.ව.1200 - 1500
(5) ක්‍රි.ව.1300 - 1500

**32.** 'දේවත්වයෙන් යුතු ආදරයේ සංඝයේ' (Congregation of the Clerics Regular of the Divine Providence) නිර්මාතෘ වූයේ,
(1) ලොයොලාහි ඉග්නේෂස්තුමා ය.
(2) කජිතාන් (කයිතාන්) තුමා ය.
(3) වින්සෙන්ති පාවුලාතුමා ය.
(4) අවිලාහි තෙරේසාතුමිය ය.
(5) කුරුසියේ ජුවාම්තුමා ය.

**33.** දේව ධර්මයට සහ ක්‍රිස්තියානි දර්ශනයට ප්‍රධාන දායකත්වයක් දැක්වූ සාන්තුවරයන් දෙදෙනා වන්නේ,
(1) හිප්පොහි අගුස්තීනුතුමා සහ ඇන්සලම්තුමා ය.
(2) ඇන්සලම්තුමා සහ බොනවෙන්චර්තුමා ය.
(3) තෝමස් අක්වයිනස්තුමා සහ හිප්පෝහි අගුස්තීනුතුමා ය.
(4) තොමස් අක්වයිනස්තුමා සහ ඇන්සලම්තුමා ය.
(5) බොනවෙන්චර්තුමා සහ ඇන්සලම්තුමා ය.

**34.** ලොයොලාහි ඉග්නේෂස්තුමාගේ 'අධ්‍යාත්මික පුහුණුව' නමැති ග්‍රන්ථය සම්පාදනය කිරීමෙහිලා ඉවහල් වූ ග්‍රන්ථ වූයේ,
(1) 'ශුද්ධවන්තයන්ගේ ජීවිතය' සහ 'ට්‍රෙන්ට් මන්ත්‍රණ සභාවේ ධර්මෝපදේශය' ය.
(2) 'ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය' සහ 'සම්පූර්ණත්වයේ මාර්ගය' ය.
(3) 'ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය' සහ 'ක්‍රිස්තු අනුසාරය' ය.
(4) 'සම්පූර්ණත්වයේ මාර්ගය' සහ 'ක්‍රිස්තු අනුසාරය' ය.
(5) 'ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය' සහ 'ශුද්ධවන්තයන්ගේ ජීවිතය' ය.

**35.** මධ්‍යතන යුගයේ දී සභා නායකයින් සහ රාජ්‍ය නායකයින් අතර ගැටුම්වලට මුල් වූ හේතුව වූයේ,
(1) සභා නායකයන් රාජ්‍ය නීති පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමයි.
(2) රාජ්‍යයන් ඔවුනොවුන් අතර සටන් වැදීමයි.
(3) රාජ්‍ය නායකයන් පාප්තුමාට කීකරු වීම ප්‍රතික්ෂේප කිරීමයි.
(4) සභා නායකයන්ගේ අධ්‍යාත්මය පිරිහීමයි.
(5) රාජ්‍ය නායකයන් විසින් සභාව ඔවුන්ගේ පාලනයට යටත්කර තබා ගැනීමට උත්සාහ කිරීමයි.

**36.** ග්‍රෙගෝරියානු සංගීතය වනාහි,
(1) තනි තාල ක්‍රමයකි.
(2) තාල එක් කළ ක්‍රමයකි.
(3) විශේෂ මිශ්‍ර තාල ක්‍රමයකි.
(4) මිශ්‍ර තාල සංගීත ක්‍රමයකි.
(5) පොලිෆොනි සංගීත ක්‍රමයකි.

**37.** පහත සඳහන් කරුණු සලකා බලන්න.
A - ඍජුකෝණාස්‍ර හැඩයකින් යුක්ත වේ.
B - කවාකාර හැඩයකින් යුක්ත වේ.
C - අඩ කවාකාර වහලයකින් යුක්ත වේ.
D - උල් ආරුක්කුවලින් යුක්ත වේ.
E - මල් කවුළුවලින් යුක්ත වේ.

මේවායින් ගොතික් ගොඩනැගිලි කලාවට පමණක් විශේෂිත වූ ලක්ෂණ ඇතුළත් වන්නේ,
(1) A හා D ය. (2) A හා E ය. (3) B හා E ය. (4) C හා D ය. (5) D හා E ය.

Department of Examinations - Sri Lanka

**38.** 'භාවනාවේ සාන්ත තෙරේසා' යනුවෙන් හැඳින්වෙන පිළිමය නෙළන ලද්දේ කුමන කලාකරුවා විසින් ද?
(1) දොනතෙල්ලෝ (2) ලියොනාර්ඩෝ ඩා වින්චි
(3) මයිකල් ආන්ජෙලෝ ය. (4) ජන් ලොරෙන්සෝ බෙර්නිනි
(5) ජොත්තො දි බොර්දෝනෙ (Giotto de Bordone)

**39.** මොසැයික් චිත්‍ර කලාවට ආවේනික **නොවන** ලක්ෂණයක් වන්නේ,
(1) කුඩා වීදුරු කැබලිවලින් සකසා තිබීම ය.
(2) වර්ණ ගැන්වූ කුඩා ලී කැබලිවලින් සකසා තිබීම ය.
(3) ගාම්භීර ස්වභාවයක් ඉස්මතු කිරීම ය.
(4) රළු ස්වභාවයක් ඉස්මතු කිරීම ය.
(5) වඩාත් අලංකාරවත් බවක් පිළිබිඹු කිරීම ය.

**40.** චිත්‍ර කලාව සඳහා භාවිත කරන නූතන විද්‍යාත්මක සහ තාක්ෂණික මෙවලම් නිර්මාණය කිරීමෙහිලා පුරෝගාමී වූයේ,
(1) රෆායෙල් සන්සියෝ ය. (2) බර්ටි සෙළි ය.
(3) මයිකල් ආන්ජලෝ ය. (4) පියේටෝ ටාෂියෝ ය.
(5) ලියොනාර්ඩෝ ඩා වින්චි ය.

**41.** පහත ප්‍රකාශ සලකා බලන්න.
A - ලතින් ජනවන්දනා ක්‍රමය අනුගමනය කිරීම
B - බටහිර සිරියානු පිළිවෙතට සම්බන්ධව පැවතීම
C - ශුද්ධෝත්තම පියතුමාගේ පාලනය පිළිගැනීම
D - මන්ත්‍රණ සභා ව්‍යුහ ක්‍රමය පිළිගැනීම
E - ජනවන්දනාව තුළ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ප්‍රමුඛස්ථානයක් ලබාදීම
මේවායින් ලතින් පිළිවෙත පිළිබඳ සඳහන් වඩාත් නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A, B සහ C ය. (2) A, C සහ D ය. (3) A, C සහ E ය. (4) B, C සහ D ය. (5) C, D සහ E ය.

**42.** ජපානයේ කිතුනු ධර්මදූත සේවාවෙහි නියැලි ප්‍රථම පැවිදි පංතිය වූයේ,
(1) කාර්මෙල් නිකායයි. (2) ජේසු නිකායයි.
(3) ෆ්‍රැන්සිස්කාන නිකායයි. (4) දොමිනිකාන නිකායයි.
(5) බෙනදිකාන නිකායයි.

● පහත වගුව ඇසුරෙන් ප්‍රශ්න අංක **43** සිට **46** දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | |
|---|---|---|---|---|
| A<br>බෙන්ජමින් රාගි | B<br>සිංහල ව්‍යාකරණ පොත | C<br>සුවිශේෂ විසර්ජනය | D<br>කිතුනු සභා විවරණය | E<br>සේනාසම්පත් |
| F<br>මතෙව් ශුභාරංචියේ සිංහල පරිවර්තනය | G<br>බුද්ධමුල | H<br>ප්‍රසාද ස්නාපන ජල බඳුන | I<br>ඥානප්පල්ලු | J<br>රජතුන් කට්ටුව |
| K<br>දුක්ප්‍රාප්ති ප්‍රසංගය | L<br>භක්ති ප්‍රබෝධනය | M<br>ඥානාර්ථ ප්‍රදීපය | N<br>සන්තියෝගු මායෝර් අම්මානෙයි | O<br>ක්‍රිස්තු උපත (ගයමවීම) |

**43.** ජාකොමේ ගොන්සාල්වේස් පියතුමාට සම්බන්ධ ග්‍රන්ථ යුගලය වන්නේ,
(1) B සහ G ය. (2) C සහ K ය. (3) D සහ I ය. (4) H සහ M ය. (5) I සහ L ය.

**44.** පූර්ව යටත් විජිත යුගයට සම්බන්ධ යුගලය වන්නේ,
(1) A සහ C ය. (2) B සහ F ය. (3) D සහ H ය. (4) E සහ I ය. (5) J සහ O ය.

**45.** පෘතුගීසි යුගයේ සාහිත්‍යයට සම්බන්ධ ග්‍රන්ථ යුගලය වන්නේ,
(1) B සහ I ය. (2) B සහ L ය. (3) C සහ I ය. (4) D සහ O ය. (5) K සහ M ය.

**46.** අතිඋතුම් එව්මන්ඩ් පීරිස් රදගුරුතුමන්ට සම්බන්ධ යුගලය වන්නේ,
(1) B සහ F ය. (2) F සහ C ය. (3) F සහ L ය. (4) G සහ L ය. (5) M සහ O ය.

[හත්වැනි පිටුව බලන්න.

Department of Examinations - Sri Lanka

**47.** පහත සඳහන් සංවිධාන පිළිබඳ සලකා බලන්න.

A - ලෝක මිෂනාරි සමුළුව
B - ක්‍රිස්තියානි තරුණ ව්‍යාපාරය
C - විශ්වාසය සහ පිළිවෙළ සඳහා වන පෙරමුණ
D - ජීවිතය සහ සේවය සඳහා වන පෙරමුණ
E - යුක්තිය, සාමය සහ මැවීම සඳහා වන කොමිසම

මේවායින් ලෝක කිතුනු සභා සම්මේලනය (WCC) ආරම්භ කිරීමට මුල් වූ සංවිධාන වන්නේ,

(1) A, C සහ D ය. (2) A, C සහ E ය. (3) B, C සහ D ය. (4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**48.** ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනය (ACC) ආරම්භ කරන ලද්දේ,

(1) ඕස්ට්‍රේලියාවේ ය. (2) ශ්‍රී ලංකාවේ ය.
(3) ඉන්දුනීසියාවේ ය. (4) පිලිපීනයේ ය.
(5) දකුණු කොරියාවේ ය.

**49.** 'අන්තර් ආගමික සංවාදය' පිළිබඳ දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ඉගැන්වීමක් **නොවන්නේ**,

(1) සැමදෙනාගේ ම ආගමික නිදහසට ගරු කිරීම ය.
(2) සැම ආගමක් ම එක හා සමාන ව සිතීම ය.
(3) වෙනත් ආගම් සහ සම්ප්‍රදායන්ට ගරු කිරීමට පෙළඹවීම ය.
(4) වෙනත් ආගම්වල ද අඩංගු විමුක්තිදායක අංග සුරැකීම ය.
(5) සැමදෙනාම එක්සිත්ව අධ්‍යාත්මික වන්දනා ගමනක යෙදිය යුතු වීම ය.

**50.** පහත සඳහන් දෑ සලකා බලන්න.

A - ආගමික ඉගැන්වීම්
B - සක්‍රමේන්තු
C - ගැළවීම
D - පාස්කු අභිරහස
E - වන්දනා ක්‍රම

මේවායින් කිතුනු සභා අතර බෙදීම්වලට පාදක වූයේ,

(1) A, B සහ C ය. (2) A, B සහ E ය. (3) B, C සහ D ය. (4) B, C සහ E ය. (5) C, D සහ E ය.

* * *

Department of Examinations - Sri Lanka

Department of Examinations - Sri Lanka
PAST PAPERS WIKI

Past Papers Wiki



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය II
கிறிஸ்தவ நாகரிகம் II
Christian Civilization II

49 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**

※ **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) පෘතුගීසින් විසින් ශ්‍රී ලංකාවේ වේදිකාගත කරන ලද නාට්‍ය **හතරක්** ලැයිස්තුගත කරන්න. (ලකුණු 2යි)

(ii) ශ්‍රී ලංකාවේ සේවය කරන ලද ක්‍රිස්තියානි අධ්‍යාපනඥයින් **දෙදෙනෙකුගේ** දායකත්වය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4යි)

(iii) පෘතුගීසි යුගයේ දී ශ්‍රී ලංකාවේ සේවය කළ ෆ්‍රැන්සිස්කාන නිකායික මිෂනාරිවරුන් විසින් පවත්වාගෙන යන ලද පාසල් වර්ග විස්තර කරන්න. (ලකුණු 6යි)

(iv) ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් පසු කිතුනුවන් විසින් සිදුකරන ලද සමාජ සේවා **දෙකක්** සාකච්ඡා කරන්න. (ලකුණු 8යි)

**2.** (i) වේදභේද මගින් ශුද්ධ වූ සභාවට ලැබුණු හිතකර ප්‍රතිඵල **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 2යි)

(ii) කුරුස යුද්ධ දියත් කිරීමට බලපෑ හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 4යි)

(iii) කුරුසියේ සාන්ත ජොහාන්තුමන් විසින් ක්‍රිස්තියානි අධ්‍යාත්මිකත්වයට දැක්වූ දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 6යි)

(iv) මුල් සියවස් පහ තුළ දී ශුද්ධ වූ සභාවේ විශ්වීය බව අනාවරණය වූ ඓතිහාසික සිදුවීම් **හතරක්** සාකච්ඡා කරන්න. (ලකුණු 8යි)

**3.** (i) මුල් කිතුනු සංඝයේ ලක්ෂණ **හතරක්** නම් කරන්න. (ලකුණු 2යි)

(ii) ශුද්ධ වූ පේදුරුතුමාගේ පළමු දේශනාවේ අඩංගු වූ මූලික කරුණු සඳහන් කරන්න. (ලකුණු 4යි)

(iii) 'ශුද්ධාත්මයාණන් තුළ ජීවිතය' පිළිබඳ පාවුලුතුමාගේ ඉගැන්වීම් සාකච්ඡා කරන්න. (ලකුණු 6යි)

(iv) ක්‍රිස්තියානි ධර්මයේ අභිවෘද්ධියට ග්‍රීක-රෝම සංස්කෘතිය දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 8යි)

Department of Examinations - Sri Lanka

## II කොටස

**4.** (i) ක්‍රි.ව. පළමුවන සියවසේ පලස්තීන සමාජය මගින් කොන් කරන ලද පව්කරුවන්, අයබදු අය කරන්නන් හා සමාරිතානුවරුන් පිළිබඳ ජේසුන්වහන්සේ දැක්වූ ආකල්පය විස්තර කරන්න.

(ii) 'ශ්‍රාවකත්වය' පිළිබඳ ජේසුන්වහන්සේගේ ඉගැන්වීම් වත්මන් ජන සමාජයට අදාළ වන ආකාරය විමසන්න. (ලකුණු 10 × 2 = 20 යි)

**5.** (i) ශුද්ධ වූ පාවුලුතුමාගේ ධර්මදූත ගමන් සහ ලිපි, කිතුනු ධර්මයේ ව්‍යාප්තියට මහත් රුකුලක් වූ ආකාරය සාකච්ඡා කරන්න.

(ii) කොවිඩ් - 19 (COVID - 19) වසංගත තත්ත්වය හමුවේ, ලාංකේය කිතුනු සභා විසින් කිතුනු විශ්වාසය නගාලීමට ගත් පියවර අගයන්න. (ලකුණු 10 × 2 = 20 යි)

**6.** (i) මිලාන් අඥාව නිසා ඇති වූ යහපත් සහ අයහපත් ප්‍රතිඵල විස්තර කරන්න.

(ii) "දේශයක පූර්ණ සංවර්ධනය සඳහා විවිධ ආගම් සහ ජාතීන් අතර සහයෝගීතාව මහඟු රුකුළකි." මෙම ප්‍රකාශය විමසන්න. (ලකුණු 10 × 2 = 20 යි)

**7.** (i) කැපුචින් පැවිදිවරුන්ගේ ජීවිත ක්‍රමය තුළ කැපී පෙනෙන ලක්ෂණ විස්තර කරන්න.


(ii) ගිහියා තුළ පූර්ණ වර්ධනයක් ඇති කිරීමෙහිලා පූජකවරුන්ට හා පැවිදිවරුන්ට දායක විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10 × 2 = 20 යි)


**8.** (i) ලන්දේසි යුගයේ දී ශ්‍රී ලංකාවේ මනා ලෙස ගොඩනැගුණු අධ්‍යාපන ක්‍රමයක් පවත්වාගෙන යන ලද්දේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ii) "ලන්දේසි මිෂනාරිවරුන් විසින් මනා ලෙස ගොඩනගන ලද අධ්‍යාපන ක්‍රමයක් මගින් ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි දහම පැතිරිණි." මෙම ප්‍රකාශය සනාථ කරන්න. (ලකුණු 10 × 2 = 20 යි)

* * *

Department of Examinations - Sri Lanka


වාරෙටම ඕන කරන පොත්
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්
Store
25% OFF
ALL BOOKS
Including Exercise Books,
CR Books, and B5 Books
ම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්
ORDER BOOKS FROM LOL BOOKS STORE


ORDER GCE A/L
SHORT NOTES, MODEL,
REVISION BOOKS & PAST
PAPERS IN SINHALA, ENGLISH
& TAMIL MEDIUM
LOL
BOOK
STORE
CASH ON DELIVERY
AND KOKO PAYMENT
AVAILABLE
WHATSAPP - 0717774440
WEBSITE: WWW.LOL.LK
GET READY FOR YOUR A/Ls